

ආචාර්ය පාලිත ගනේවත්ත

පීතු පාදං

"පීතු පාදං" නැමැති ඩී. බී. කුරුප්පු මහතා ඔස්ට්‍රේලියාවට පැමිණි පසු ලියූ දෙවන පොත යයි මම සිතමි. මෙරටට පැමිණීමෙන් පසුව ලියූ පළමු පොත වන 'ලංකාවක් වගේ පුංචි' මෙන්ම 'පීතු පාදං' පොතද පළ කර ඇත්තේ 1998 දීය. 'පීතු පාදං' කෙටි කතා පොතක් හැටියට ඩී. බී. නම් කර ඇත්තේ. එහෙත් මීට පෙර ලිපියකින් මා ඩී. බී. ගේ කෙටිකතා විමසුමට ලක් කරන විට හිතාමතාම 'පීතු පාදං' පොත කෙටි කතා පොත් ගොන්නට ඇතුලත් නොකළෙමි. පොතේ නමින් ම හෙළිවන පරිදි එය මිය ගිය තම පියා කෙරෙහි වූ අසීමිත පිතෘ ප්‍රේමය හා ආදර භක්තිය හෙළි කරනු පිණිස පියා හා සම්බන්ධ තම ජීවිතයේ අත්දැකීම් සිහිකර ලියූවකි. ඩී. බී. 2005 දී ලියා පල කළ ඔහුගේ ස්වයං චරිතාපදානය ලෙස සැලකිය හැකි 'හැන්දෑවට පායන හිරු' පොතට අදාලව එහි මුල් කොටස වැනි ස්වයංචරිතාපදාන ලක්ෂණ ඇතිව ලියූ රචනා පෙළකි 'පීතු පාදං'. 'පීතු පාදං' යනු තම පියා පිළිබඳ සත්‍ය තොරතුරු ඇතුලත් චිත්ති සංග්‍රහයක් ලෙස හැඳින්වීමට මා කැමතියි.

'පීතු පාදං' පොතේ කතා අටකි. එයින් මුල් කතා හතම ශ්‍රී ලංකාවේ තම පියා සමග ගත කළ ජීවිතයේ හා පියා මියගිය පසු ඇතුළු විවිධ අවස්ථාවලදී කතුවරයා ලත් අත්දැකීම් අනුසාරයෙන් ලියවුන කතා හතකි. 'යුධ සමරුව' නැමැති අවසාන කතාව මෙරටදී ලත් අත්දැකීමත් අසුරෙන් ලියවුණකි. කලින් පළකළ 'ලංකාවක් වගේ පුංචි' කෙටිකතා සංග්‍රහයටද ඇතුලත් කර තිබූ 'යුධ සමරුව' තම පියා සම්බන්ධව අත්දැකීම් සිහිපත් වුවත් අතික් කතා හතට පාදක වූ පියා හා සම්බන්ධ සජීවී අත්දැකීම්වලින් තොරය. 'යුධ සමරුව' පීතු පාදං' පොතේ අනෙක් කතා හතෙන් නිරූපිත නිර්මාණාත්මක වාතාවරණයට නොගැලපෙන්නක් ලෙසිනි පොත කියවා හමාර කළ විට හැඟී යන්නේ.

පොතේ නම ගත් 'පීතු පාදං' නැමැති පළමු කතාව පසුගිය සියවසේ මැද භාගයේ ලංකාවේ ගම්බද ජන ජීවිතය පවුලේ දෙමාපියන් හා දූ දරුවන් අතර අන්‍යෝන්‍ය සබඳතා ගැන ඉඟියක් පළ කරයි. දරුවෝ කෙළින්ම පියා ඇමතීමට මැළි වෙති. පියාට යමක් කියවන්න් මව ලවාය. ගම්බන්ද ගැහැනුන් හා මිනිසුන් අතර පැවති අනියම් සබඳතා හා තම පියා පිළිබඳවන තොරතුරු ඉතා නිර්ව්‍යාජ අන්දමින් හෙළි කිරීමට කතුවරයා සමත් වී ඇත.

පොතේ නම ගත් 'පීතු පාදං' නැමැති පළමු කතාව පසුගිය සියවසේ මැද භාගයේ ලංකාවේ ගම්බද ජන ජීවිතය පවුලේ දෙමාපියන් හා දූ දරුවන් අතර අන්‍යෝන්‍ය සබඳතා ගැන ඉඟියක් පළ කරයි. දරුවෝ කෙළින්ම පියා ඇමතීමට මැළි වෙති.

'තාත්තගේ පුත්තු' නැමැති දෙවන කතාව ගැමි ජීවිතයේ දිළිඳු බව හා අසරණ බව නිරූපණය කරන කතාවකි. මේ කතාවට යොදාගත් බස්වහර කතා කරන බසයි. එය කතාව තුලින් ඊවගිත වන නිර්ව්‍යාජත්වයට සරිලන සරල බස් වහරකි.

'තාත්තා හැඩූ දා' යන්න පියා පිළිබඳ අනුවේදනීය සිදුවීමක් පාදක කරගත් කතාවකි. පුතාව කොළඹ පාසලට යාමට බස් වියදම වන සත හැත්තෑපහක් සොයා ගැනීමට බැරිව තාත්තා හැඩූ සැටි. දරදඬු මිනිසකු වූ පියා තුළ පැලපදියම්ව තිබූ දෘඪ දාරක ප්‍රේමය නිරූපණය කරන කතාවකි. ඩී. බී. කුරුප්පු මහතාගේ කතාවක් කියවීමේදී ඇසට කඳුළු නැගුණ පළමු වතාව ඔහුගේ 'අන්තිම උපන්දින සාදය' නැමැති කෙටි කතා පොතේ එන 'තාත්තේ අපි ඔබට ආදරෙයි' කෙටිකතාවේ අවසානයයි. දෙවන අවස්ථාව 'තාත්තා හැඩූ දා' නැමැති කතාවයි.



'නිවාස තහංචිය නැමැති කතාව පවුල් ජීවිතයේ අත්දැකීමකි. අනික සිදුවීමක් ආවර්ජනය කරන මේ කතාවෙ ස්වයංපාපොච්චාරණයක් ලෙස හැඳින්විය හැකිය. පියාට ඇති ආදර ගෞරවයත් තමන්ගෙන් පියාට වූ අතපසුවත් අතර ඇතිවන අභ්‍යන්තර ගැටුම ගැඹුරින් විමසා බැලීමට කතුවරයා උත්සුක වී ඇත. එම කතාවට පාදක වූ අත්දැකීමට උචිත වියත් බස් වහරක් මේ කතාවට පිවිස ඇත.

ඉතා සංයමයෙන් යුතුව කට බස් වහර යොදාගෙන ලියවුණ 'පරිවර්තනය' නැමැති කතාවට හැඩ දැඩි චරිතයකින් යුතුව ජීවත් වූ තාත්තා සන්සුන් තැන්පත් වූ අවධියේ ලත් අත්දැකීමක් පදනම් වී ඇත.

'බුලත් හුරුළුල නම් වූ කතාව කතුවරයාගේ විවාහ ජීවිතයේ ගැටුමක් පෙන්වන පුවතකි. තාත්තාගේ අවසන් කාලයේදී බිරිඳ විසින් ඔහුට බුලත් හුරුළුලක් දී වැදීම කතුවරයා නොසිතූ විරූ අත්දැකීමකි. මේ සිදුවීමට හේතුසාධක විමසමින් කතුවරයාගේ සිත තුළ ඇතිවන අභ්‍යන්තර අරගලය පාඨකයා වෙහෙසට පත් කරවන තරමට දිගේ ගස්සමින් කෙරෙන චිත්ත සංහාරයෙන් කතාව අවසන් වෙයි.

පියාගේ ආදාහනයට පැමිණි හා නොපැමිණි අය ගැන සිතමින් නිරූපිත ස්වයංභාෂණයකි පශ්චත්තාපය. සිය පවුල් ජීවිතයේ විරසකයක් නිසා පියාගේ තුම්මාසයේ දානයට යාමට නොහැනවීම නිසා කතුවරයා දැඩි පසුතැවිල්ලට පත්වෙයි. ඔස්ට්‍රේලියාවට පැමිණ සිටි තම සගයෙකු ස්වකීය පියාගේ තුන්මාසයේ දානයට පිටරට සිට ලංකාවට පැමිණීම දැනගත් කතුවරයාගේ කණස්සල්ල තිව්‍ර වෙයි.

'පීතු පාදං' පොත ඩී. බී. විසින්ම AT MY FATHER'S FEET නමින් 2001 දී ඉංග්‍රීසියට අනුවාද කරන ලදී. කතුවරයා විසින් ම අනුමත කිරීම නිසා එය ඉතා පරිපූර්ණ අනුවාදයක් බවට පත් ව ඇත. 'පීතු පාදං' මුල් පොත් බස් වහරින් ඩිවනිත වන නිර්ව්‍යාජත්වය එලසින්ම ඉංග්‍රීසි අනුවාදයෙන් ද පිළිබිඹු වෙයි. 'පීතු පාදං' යටතේ අන්තිම කතාව වන 'යුධ සමරුව' අනුවාදයක් ලෙසින් ඉංග්‍රීසි පොතට ඇතුලත් කර නැත.

පීතු පාදං සිංහල පොත් හා ඉංග්‍රීසි පොතේ පිටකවරය අමුඩයෙන් සැරසුණ ඩී. බී. ගේ පියාගේ තාත්තාගේ ජීවමාන රූපය මවා පෑමේ සුවිශේෂ බලයක් එම ඡායාරූපය සතු බව ඩී. බී. පවසයි. සරළ දිවි පෙවෙතක් ගෙවන ගැමියෙකුගේ දෛනික දිවි පෙවත පිළිබිඹු කරන එම ඡායාරූපය පීතු පාදං පොතෙන් නිරූපණය වන අව්‍යාජත්වයට ඉතා උචිතය.

මතු සම්බන්ධයි

Community Announcements from The Australia Sri Lanka Catholic Association

1.A Requiem Mass in Sinhala and English
මළවඩන් වෙනඩවෙන් දේව මෙහෙය

Celebrated by Rev Fr Calton De Silva and Rev Fr Crysantha Jayalath

Date - Sunday 7th November 2010
Time - 3.30 pm
Venue - St James the Apostle's Church, 330 Derrimut Road, Hoppers Crossing North
Please bring a plate for the fellowship after the mass.

2. Annual Christmas Carols

Date - Saturday 4th December 2010 at 7 pm
Venue - St Jude's Church, 49 George Street, Scoresby

For more details please ring

Rev Sister Concepta on 52773620 or Suresh on 97634649

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia